තාක්ෂණික ක්ෂේත්‍රය - ආරම්භක තාක්ෂණවේදය

**03 පාඩම**

## නිසි ආවුද නිසි කාර්යයට

භාණ්ඩ තැනීමේදී අවශ්‍ය වන ආවුද හා උපකරණ

- ★ ආවුද

  කැපීමෙන් කොටස් වෙන් කිරීම සඳහා භාවිතා කරන දෑ ආවුද ලෙස හැඳින්වේ. උදා:- කියත, තහඩු කතුර

- ★ උපකරණ

  කැපීමක් සිදුනොවන කාර්යයන් වලදී භාවිතා කරන දෑ උපකරණ වේ. උදා :- මිටිය, දුණු බෙදුම් කටුව, අතකොලුව

භාණ්ඩය තැනීමේදී උචිත ආවුද හා උපකරණ තෝරාගැනීම හා නිවැරදි භාවිතය පිළිබඳ හැකියාව තිබිය යුතුය.

පහත දැක්වෙන්නේ තාකෂණික කාර්යයන් සිදු කිරීම සඳහා අවශ්‍යවන ආවුද හා උපකරණ කිහිපයකි.

| | |
|---|---|
| වානේ කෝදුව  | ★ මල නොබැදෙන වානේ වලින් සාදා ඇත. ★ එක් පසෙක සෙන්ටිමීටර හා අනෙක් පස අඟල් ආදී වශයෙන් සලකුණු කර ඇත. ★ ලෝහ ආශ්‍රිත මැනුම් සඳහා භාවිතා කරයි. |
| අදින කටුව   | ★ ලෝහයක් මත ඇඳිය යුතු කැපුම් රේඛා ඇඳ ගැනීම සඳහා භාවිතා කරයි. ★ මෙහි ඇති සියුම් උල් තුඩු මගින් අදිය යුතු පෘෂ්ඨය සිරී යන සේ අදියි. බඳෙහි ඇති කැරලි නිසා ලිස්සායම වළකියි. |

| | |
|---|---|
| දුනු බෙදුම් කටුව<br><br> | ★ මුදුනේ දුනු මුද්දක් ඇත. ඉස්කුරුප්පුව කරකවා දෙපා සීරු මාරු කරගත හැකිය.<br>★ ලෝහ මත වෘත්තාකාර හැඩ ඇඳීමට භාවිතා කරයි.<br>★ තුඩ වානේ වලින් නිපදවා ඇත. |
| අත් කියත<br> | ★ කුඩා ලී කැබලි කැපීම හා ඉරීම සඳහා භාවිතා කරයි.<br>★ කැපීමේ පහසුව සඳහා දැති හැඩගසා ඇති අතර පීර මඟින් මුවහත් කරයි. |
| කපන කටුව<br> | ★ විශේෂිත වානේ වලින් නිපදවා ඇත. ලෝහ තහඩු, පට්ටම්, දඬු, කම්බි කැපීම, සෑහීම සඳහා භාවිතා කෙරේ.<br>★ තුඩේ හැඩය අනුව විවිධ කපන කට ඇති අතර තුඩ දැඩි ලෙස පණ පොවා ඇත. |
| තහඩු කතුර<br> | ★ තුනී ලෝහ තහඩු , PVC තහඩු කැපීමට භාවිතා කරයි.<br>★ තහඩුවේ ස්වභාවය අනුව කතුර තෝරාගත යුතුය.<br>★ විශේෂිත වානේ වලින් නිපදවා ඇත. |
| පැති නියන<br> | ★ ලී මත කැටයම් කැපීම සෑහීම හා පට්ටම් කැපීමට භාවිතා කරයි. |
| පීර<br> | ★ වානේ වලින් නිපදවා ඇති අතර භාවිතයේ දී මිටක් සවිකරගත යුතුය.<br>★ විවධ වර්ගයේ පීරි ඇත.<br>★ ලෝහ හැඩගැන්වීම සඳහා භාවිතා කරයි. |

| | |
|---|---|
| යත්ත (යතු කැටය)<br> | ★ ලී හෝ ලෑලි සුමට කිරීමට භාවිතා කරයි.<br>★ ලී හෝ යකඩ වලින් සාදයි.<br>★ සිදුකරන කාර්යය අනුව විවිධ යතු වර්ග භාවිතා කරයි. |

01) ඉහත සටහන අභ්‍යාස පොතේ සටහන් කරගන්න.

02) ලෝහ නියන, බුරුමය, අතකොලුව, අඬුමිට්ටිය, ඉස්කුරුප්පු නියන, දඬු අඬුව, පොදු අත් අඬුව හා බවුතය යන ආවුද හා උපකරණ සඳහා ඉහත වගුව සම්පූර්ණ කරන්න.

03) පෙළපොතේ සඳහන් ආම්පන්න ආවුද හා උපකරණ ලෙස වර්ග කරන්න.